කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : **11** TCA/26/01/09/03
වර්ණය : රතු

## ශ්‍රී ලංකාවට ගිනිකොණ දෙසින් පවතින ගැඹුරු පීඩන අවපාතය පිලිබඳ අනතුරු ඇඟවීම් නිවේදනය


**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්**
2026 ජනවාරි මස 10 වන දින පෙ.ව. 06.30 දක්වා වලංගු වන පරිදි 2026 ජනවාරි මස 09 දින පෙ.ව. 06.30 ට නිකුත් කරන ලදී.

### ගොඩබිම් ප්‍රදේශ සහ දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා

**ආරක්ෂිත ක්‍රියාමාර්ග ගන්න!**

**ශ්‍රී ලංකාවට ගිනිකොන දෙසින් බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පවතින ගැඹුරු පීඩන අවපාතය (2026 ජනවාරි 9 පෙ.ව. 06.00 වන විට විට මඩකලපුව සිට කිලෝමීටර් 170 ක් පමණ නැගෙනහිර දෙසින් පිහිටා තිබුණි.) එය වයඹ දෙසට ගමන් කර 2026 ජනවාරි 9 වන දින සවස් කාලයේදී පොතුවිල් සහ ත්‍රිකුණාමලය අතර ශ්‍රී ලංකා වෙරළ තීරය හරහා ගමන් කිරීමට බොහෝ දුරට ඉඩ ඇත.**

**එහි බලපෑම හේතුවෙන් දිවයිනේ, විශේෂයෙන් උතුරු, උතුරු-මැද, නැගෙනහිර, ඌව සහ මධ්‍යම පළාත්වල වැසි සහ සුළං තත්ත්වයේ වර්ධනයක් බලාපොරොත්තු වේ.**




*ගැඹුරු පීඩන අවපාතයේ ගමන් මාර්ගය. මූලාශ්‍රය: RSMC*

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**ගොඩබිම ප්‍රදේශය සඳහා :**

**ඉදිරි දින තුන සඳහා තද සුළං පිළිබඳ අනතුරු ඇඟවීම.**

| පළාත | ජනවාරි 09 | ජනවාරි 10 | ජනවාරි 11 |
|---|---|---|---|
| උතුර | **පැ.කි.මී. (50-60)** දක්වා වන **ඉතා තද සුළං සමඟ විටින් විට හමන පැ.කි.මී. 70** දක්වා වන **ප්‍රහාරාත්මක සුළං** | විටින් විට පැ.කි.මි.(50-60) පමණ දක්වා වන තද සුළං | විටින් විට පැ.කි.මි.(30-40) පමණ දක්වා වන සුළං |
| උතුරු-මැද | **පැ.කි.මී. (50-60)** දක්වා වන **ඉතා තද සුළං සමඟ විටින් විට හමන පැ.කි.මී. 70** දක්වා වන **ප්‍රහාරාත්මක සුළං** | විටින් විට පැ.කි.මි.(40-50) පමණ දක්වා වන තරමක තද සුළං | විටින් විට පැ.කි.මි.(30-40) පමණ දක්වා වන සුළං |
| නැගෙනහිර | **පැ.කි.මී. (50-60)** දක්වා වන **ඉතා තද සුළං සමඟ විටින් විට හමන පැ.කි.මී. 70** දක්වා වන **ප්‍රහාරාත්මක සුළං** | විටින් විට පැ.කි.මි.(40-50) පමණ දක්වා වන තරමක තද සුළං | විටින් විට පැ.කි.මි.(30-40) පමණ දක්වා වන සුළං |
| සබරගමුව | පැ.කි.මි.(30-40) පමණ දක්වා වන තරමක තද සුළං | විටින් විට පැ.කි.මි.(30-40) පමණ දක්වා වන සුළං | විටින් විට පැ.කි.මි.(30-40) පමණ දක්වා වන සුළං |
| බස්නාහිර | විටින් විට පැ.කි.මි.(50-60) පමණ දක්වා වන තද සුළං | විටින් විට පැ.කි.මි.(30-40) පමණ දක්වා වන සුළං | විටින් විට පැ.කි.මි.(30-40) පමණ දක්වා වන සුළං |
| දකුණ | විටින් විට පැ.කි.මි.(30-40) පමණ දක්වා වන සුළං | විටින් විට පැ.කි.මි.(30-40) පමණ දක්වා වන සුළං | විටින් විට පැ.කි.මි.(30-40) පමණ දක්වා වන සුළං |
| ඌව | විටින් විට පැ.කි.මි.(50-60) පමණ දක්වා වන තද සුළං | විටින් විට පැ.කි.මි.(30-40) පමණ දක්වා වන සුළං | විටින් විට පැ.කි.මි.(30-40) පමණ දක්වා වන සුළං |
| වයඹ | විටින් විට පැ.කි.මි.(50-60) පමණ දක්වා වන තද සුළං | විටින් විට පැ.කි.මි.(40-50) පමණ දක්වා වන තරමක තද සුළං | විටින් විට පැ.කි.මි.(30-40) පමණ දක්වා වන සුළං |
| මධ්‍යම | විටින් විට පැ.කි.මි.(50-60) පමණ දක්වා වන තද සුළං | පැ.කි.මි.(40-50) පමණ දක්වා වන තරමක තද සුළං | විටින් විට පැ.කි.මි.(30-40) පමණ දක්වා වන සුළං |

**ඉදිරි දින තුන සඳහා තද වැසි පිළිබඳ අනතුරු ඇඟවීම**

| පළාත | දිස්ත්‍රික්කය | ජනවාරි 09 | ජනවාරි 10 | ජනවාරි 11 |
|---|---|---|---|---|
| උතුර | මුලතිව් | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මී. 100 ට වැඩි තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මී. 50 දක්වා තරමක තද වැසි | වැසි වාර කීපයක්. |
| | යාපනය | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මී. 100 ට වැඩි තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මී. (75-100) දක්වා තරමක තද වැසි | වැසි වාර කීපයක්. |
| | වවුනියා | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මී. 100 ට වැඩි තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මී. 50 දක්වා තරමක තද වැසි | වැසි වාර කීපයක්. |
| | මන්නාරම | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, | වැසි වාර කීපයක්. |

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

| | | | | |
|---|---|---|---|---|
| | | ඇතැම් ස්ථාන වලට මි.මි. 100 ට වැඩි තද වැසි | ඇතැම් ස්ථාන වලට මි.මි. 50 දක්වා තරමක තද වැසි | |
| | කිලිනොච්චි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. 100 ට වැඩි තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. (75-100) දක්වා තරමක තද වැසි | වැසි වාර කීපයක්. |
| උතුරු-මැද | අනුරාධපුර | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. 100 ට වැඩි තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි |
| | පොලොන්නරුව | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. 100 ට වැඩි තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි |
| නැගෙනහිර | ත්‍රිකුණාමලය | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. 100 ට වැඩි තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි | වැසි වාර කීපයක්. |
| | අම්පාර | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. (50-75) දක්වා තරමක තද වැසි | වැසි හෝ ගිගුරුම් සහිත වැසි | වැසි වාර කීපයක්. |
| | මඩකලපුව | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. (50-75) දක්වා තරමක තද වැසි | වැසි හෝ ගිගුරුම් සහිත වැසි | වැසි වාර කීපයක්. |
| සබරගමුව | රත්නපුර | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි |
| | කෑගල්ල | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි |
| බස්නාහිර | කොළඹ | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | වැසි ස්වල්පයක් |
| | කළුතර | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි |
| | ගම්පහ | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | ප්‍රධාන වශයෙන් වැසි රහිත. |
| දකුණ | ගාල්ල | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි |
| | මාතර | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි |

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

| | | | | |
|---|---|---|---|---|
| | හම්බන්තොට | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | වැසි වාර කීපයක්. |
| ඌව | මොණරාගල | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි. | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | වැසි වාර කීපයක්. |
| | බදුල්ල | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි. | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | වැසි වාර කීපයක්. |
| වයඹ | කුරුණෑගල | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි. | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | ප්‍රධාන වශයෙන් වැසි රහිත. |
| | පුත්තලම | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි. | විටින් විට වැසි | ප්‍රධාන වශයෙන් වැසි රහිත. |
| මධ්‍යම | මහනුවර | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. (50-75) දක්වා තරමක තද වැසි | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි |
| | නුවරඑළිය | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. (50-75) දක්වා තරමක තද වැසි | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි |
| | මාතලේ | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. 100 ට වැඩි තද වැසි | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | වැසි වාර කීපයක්. |

අවදානම් රහිත    අඩු අවදානම්    මධ්‍ය අවදානම්    අධි අවදානම්

**ගොඩබිම ප්‍රදේශය සඳහා:**

**සිදුවිය හැකි හානි**

- .
- පැල්පත්වලට හා තාවකාලික ඉදි කිරීම්වලට හානි වීම .
- වහලවල ඇති තහඩු උළු ආදිය ගැලවී යාම.
- විදුලි සහ දුරකථන රැහැන් වලට හානි සිදුවිය හැක.
- ගස්වල අතු කැඩීම් සහ මාර්ග අසල ඇති විශාල ගස් ගැලවී යා හැක.
- වී වගා බිම්වලට,කෙසෙල්, පැපොල් වැනි පළතුරු වගාවන් වලටද හානි සිදුවිය හැක.
- වරාය ආශ්‍රිතව නවතා /රඳවා ඇති යාත්‍රා අංගන වලට හානි වීම
- ක්ෂණික ගංවතුර තත්ත්වයන් ඇතිවිය හැක
- වෙරළාසන්න පහත් ගොඩබිම් ප්‍රදේශ මුහුදු ජලයෙන් යටවිය හැක.


අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග:

- **වෙරල ආසන්න තාවකාලික පදිංචිකරුවන් ආරක්ෂිත ස්ථාන වලට ගමන් කිරීම. බලපෑම් ඇති ප්‍රදේශවල අනෙකුත් පදිංචිකරුවන් නිවාස තුලට වී සිටීම.**

- **කඳුකර ප්‍රදේශ වල (විශේෂයෙන් නාය යාමේ අවධානම සහිත ප්‍රදේශ වල) සහ ගංගා ආශ්‍රිතව පහත් බිම් වල ජීවත් වන ජනතාව මේ සම්බන්ධයෙන් විමසිලිමත්වන්න.**
- **කඳුකර ප්‍රදේශ වල මාර්ග භාවිත කරන්නන් සහ රථ වාහන පදවන්නන් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න**
- **කඩාවැටෙන ගස්වලින් සහ විදුලි රැහැන් වලින් ආරක්ෂාවීම.**
- **ගිගුරුම් සහිත වැසි පවත්නා අවස්ථාවල රැහැන් දුරකථන සහ විදුලි උපකරණ භාවිතයෙන් වැළකීම.**
- **ඇතිවිය හැකි අයහපත් කාලගුණික තත්වය පිළිබද විමසිලිමත්වන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.**
- **හදිසි තත්වයකදී ප්‍රාදේශීය ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන නිලධාරීන් ගේ සහය පතන්න.**
- **කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.**

**මුහුදු ප්‍රදේශ සඳහා:**

**Advisory for Deep Depression over Southeast Bay of Bengal.**
**issued at 06.30 a.m. on 09 January 2026, for the period until 06.30 a.m. 10 January 2026.**




**මුහුදු ප්‍රදේශ සඳහා අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග:**

- **<u>නැවත දැනුම් දෙන තුරු දිවයින වටා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවුක කටයුතුවලින් වැළකී සිටින ලෙස දැනුම් දෙනු ලැබේ.</u>**
- **උතුරු අක්ෂාංශ 04 - 14 ත් අතර සහ නැගෙනහිර දේශාංශ 76 - 85 ත් අතර මුහුදු ප්‍රදේශයට නැවත දැනුම් දෙන තුරු යාත්‍රා නොකරන ලෙස ධීවර සහ නාවික ප්‍රජාවන්ට දැනුම්දෙනු ලැබේ.**
- **දැනට මෙම මුහුදු ප්‍රදේශ වල ධීවර කටයුතුවල යෙදී සිටින පිරිස වහාම ගොඩ බිමට හෝ ආරක්ෂිත ස්ථානයක් වෙත පැමිණෙන ලෙසට දන්වා සිටිනු ලැබේ.**

**මේ සම්බන්ධයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අනාවැකි සහ නිවේදන පිළිබඳව, ධීවර සහ නාවික ප්‍රජාව අවධානයෙන් පසුවන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.**
**පද්ධතියේ හැසිරීම පිළිබඳව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නිරන්තර අවධානයෙන් සිටියි. මේ සම්බන්ධයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ඉදිරි අනාවැකි සහ නිවේදන පිළිබඳව අවධානයෙන් පසුවන ලෙස මහජනතාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.**

කාර්යයේ නියුතු කාලගුණ විද්‍යාඥ
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව.
දු. ක: 0112 686 686 (පැය 24 ක්‍රියාත්මකයි)